**තිරප්පනේ ප්‍රාදේශීය සභාව - 2021**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**තිරප්පනේ** ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය/ ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය  සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන  ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.  පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය  තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා  මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට  අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර  පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව  ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉකුත් වර්ෂයේ ඉදිකර ප්‍රාදේශීය සභාව වෙත පවරන ලද වටිනාකම රු.153,133,568 ක්වූ පාලම් 04 ක් වටිනාකම රු.1,344,000 ක්වූ ජල පෙරණ ගොඩනැගිල්ලක් සහ වටිනාකම රු.253,168 ක්වූ LDSP ව්‍යාපෘතිය මගින් ඉදිකරන ලද කැටගල් අල්ලන ලද මාර්ගයක වටිනාකම් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට බැර නොකර සමුච්චිත අරමුදලට ගලපා තිබීම නිසා පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයේ පැවරුම් වටිනාකම හා අතිරික්තයේ/ ඌණතාවයේ හඳුනාගත් ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම රු.15,372,312 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | ව්‍යාපෘතියක වියදම් සහතික කර නොතිබූ නමුත් එම ව්‍යාපෘතියේ ඉඩම් ගොඩනැගිලි වත්කම් වැඩිවීම් රු.17,545,953 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ඉඩම් හා ගොඩනැගිලි සහ ප්‍රාග්ධන ප්‍රදාන එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. |
| (ඇ) | LDSP ව්‍යාපෘතිය යටතේ කෘෂි නිෂ්පාදන වෙළඳ සැලක් ඉදිකිරීම සඳහා ගිවිසුම්ගත වී තිබුණු නමුත් කිසිදු වැඩ කොටසක් ඉටුකළ බවට සහතික කර නොතිබියදී ගිවිසුම්ගත වටිනාකම ණයහිමියන් හා ණයගැතියන් ලෙස ගිණුම්ගත කිරීම නිසා ණයහිමියන් රු.17,500,000 කින් සහ ණයගැතියෝ රු.6,324,303 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනික කරන ලද ව්‍යාපෘති 04 ක සහතික කළ වැඩවල වටිනාකම වෙනුවට වෙන්කළ මුළු ප්‍රතිපාදන මුදල ගිණුම්ගත කිරීම නිසා ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම හා ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම රු.6,164,136 ක් වැඩිවී තිබුණි. | 2022 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී විකුණුන ලද පිරිවැය රු.20,000 ක්වූ ඡායා පිටපත් යන්ත්‍රයක් සටහන් අංක 16 හි ඉවත් කිරීම් ලෙස හෙළිදරව් නොකර වර්ෂයේ එකතු කිරීම් වලින් අඩුකර දක්වා තිබුණි. | 2022 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වත්කම් සහ වගකීම් ප්‍රකාශයට අදාළ සටහන් අංක 16 අනුව අයිතම 03 ක වටිනාකම් සහ උපලේඛනවල සඳහන් වටිනාකම අතර රු.2,712,303 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී සකස් කරන මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අයභාරය ඉක්ම වු පුනරාවර්තන වියදම රු.13,771,043 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අයභාරය ඉක්ම වු පුනරාවර්තන වියදම රු.8,192,258 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් හා කසළ බදු ආදායම රු.564,603 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරමි. | අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | **කුලී**<br>----- | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කුලී ආදායම රු.405,245 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | **බලපත්‍ර ගාස්තු** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බලපත්‍ර ගාස්තු ආදායම වූ රු.1,766,040 තුළ නිවැරදිව ඇස්තමේන්තු නොකරන ලද | අයකරගත යුතු ආයතන පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු සභාව සතුව නැත. | වර්ෂය ආරම්භවීමට පෙර ව්‍යාපෘතිය පිළිබඳ සමීක්ෂණයක් කර බිල් කිරීම කළයුතුය. |

උල්ගල්ල හෝටලයෙන් ලැබිය යුතු රු.1,700,000 ක ඇස්තමේන්තුගත ආදායම ඇතුළත්ව තිබුණු අතර එම හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිතව පැවති උට්ටිමඩුව කුච්චිවාලික්කම් සංවර්ධන ව්‍යාපෘතියට 2018 ජුනි 05 දින සභාව වෙත රු.50,000 ක් ලැබී තිබුණු නමුත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර සමාලෝචිත වර්ෂයේ වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ එම වටිනාකම ණයහිමියන් ලෙස දක්වා තිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට හෝ ආපසු හරවා යැවීමට කටයුතු කරමි. | කළමනාකාරීත්වය නියමිත පරිදි ව්‍යාපෘතිය ඉටුකිරීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | 2018, 2019 සහ 2020 වර්ෂවල විගණන ගාස්තු රු.369,200 ක් ගෙවීම් කිරීම සඳහා සභාව 2021 වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | මුදල් ලද විගස ගෙවීමට කටයුතු කරමි. | ගෙවීමට ක්‍රියාකළ යුතුවේ. |
| (ඇ) | පූර්ව වර්ෂ 05 - 11 ක් ඉක්ම වූ කාලයක සිට මුල්‍ය ප්‍රකාශනවල පැවත එමින් තිබෙන සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.285,874 ක්වූ ගිණුම් ශේෂ 06 ක් අයකරගෙන නොතිබුණි. | තහවුරු කර ගැනීමට සාක්ෂි නොමැති බැවින් නිරවුල් කර ගැනීමට නොහැකි වී ඇත. | නිරවුල් කිරීමට ක්‍රියාකළ යුතුවේ. |
| (ඈ) | සභාව විසින් වසර 02 ක කාලයක් තුළ රැස්කරන ලද මුද්දර බදු රු.128,050 ක් දේශීය ආදායමේ දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකර සභාවේ රඳවා ගෙන තිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමට කටයුතු කරමි. | ප්‍රේෂණය කිරීමට කටයුතු කළයුතු වේ. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට වාහන හා උපාංග 04 ක් වසර 06 ක් ඉක්මවූ කාලයක සිට අක්‍රීය තත්ත්වයේ පැවති අතර එම වාහන 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අපහරණය කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකළ යුතුවේ. |
| (ආ) | දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 2018 දෙසැම්බර් 29 දින සභාව වෙත ලැබී තිබුණු භාණ්ඩ අයිතම 33 ක් අදාළ කාර්යයට යොදා නොගෙන ගබඩාවේ රඳවාගෙන තිබුණි. | පවතින ආර්ථික දුෂ්කරතා හේතුවෙන් දිවා සුරැකුම් මධ්‍යස්ථානය ආරම්භ කිරීමට නොහැකි වී ඇත. | ප්‍රයෝජනයට ගැනීමට ක්‍රියාකළ යුතුවේ. |
| (ඇ) | 2010 වර්ෂයේදී උතුරු මැද පළාත් සභාවෙන් ලද වටිනාකමරු.640,300 ක්වූ සහල් සැකසුම් මධ්‍යස්ථාන උපකරණ අයිතම කිසිදු ප්‍රයෝජනයක් නොගෙන ගබඩා තුළ රඳවා ගෙන තිබුණි. | මහා සභාවේ විරෝධතා හේතුවෙන් වෙන්දේසි කිරීමට නොහැකි වී ඇත. | |